කොටින්ට එරෙහි වූ ව්‍යාඝ්‍රයා

ආනන්ද සංගරී

දෙමළ ජනතාවගේ එකම නියෝජිතයා ලෙස පෙනී සිටින කොටි සංවිධානය උතුරු නැගෙනහිර පළාත්වල වෙසෙන ජනයාගේ ජීවත් වීමේ අයිතිය උදුරාගනිමින් සිටියි. ඔවුන් ඒ සඳහා තුවක්කුවේ බලය යොදාගෙන තිබේ. ඊට එරෙහි වන, එකඟ නොවන අයට සිදුවන්නේ උණ්ඩයට බිලි වීමටයි. වසර විස්සක කාලයක සිට කරගෙන එනු ලබන මේ මර්දනකාරී ක්‍රියාදාමයට විරුද්ධ දෙමළ පාක්ෂිකයන් සංඛ්‍යාවද අතිමහත්ය.

පසුගිය කාලයේ කොටි සංවිධානය සග එක්ව කටයුතු කළ නැගෙනහිර කොටි සන්නද්ධ නායක කරුණා, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ ඇතැම් කොටස්, ඊ.පී.ඩී.පී, ප්ලොට්, ඊ.පී.ආර්.එල්.එෆ් හි කොටසක් ආදී පාර්ශව මෑත කාලයේ කොටින්ට එරෙහිව කටයුතු කරන පාර්ශව කිහිපයකි.

උතුරු නැගෙනහිර දෙමළ ජනතාවගේ දුක් පීඩා ගැන කතා නොකරන පසුබිමක් තුළ කොටි සංවිධානයේ ක්‍රියාකාරකම්වලට එරෙහිව දෙමළ ජනයා වෙනුවෙනුත්, නොබෙදුණු රටක් වෙනුවෙනුත් හඬ නගන්නන් අතර ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණු නායක වී ආනන්ද සංගරී මහතාට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.

දෙමළ ජනතාව වෙනුවෙන් සටන් කිරීමට ඔහුට ඇත්තේ සුළු අවි කිහිපයකි. ඒ ඔහුගේ කට හා ඉන් පිටවෙන වචනය. එහෙත් ඇතැම් විට ඔහුගේ එම අවි කොටින්ගේ තුවක්කු බෝම්බවලට වඩා බලසම්පන්න බවක් පෙනේ.

"කොටියා දැන් හීලෑ විය යුතුයි. එසේ නැතහොත් හිලෑ කළ යුතුයි. ජාත්‍යන්තර ප්‍රජාව විසින් ඒ බව ඔවුන්ට පැවසීමට කාලය දැන් එළඹිලා තිබෙනවා. ශ්‍රී ලංකා රජය දැනට ඕනෑවටත් වැඩියෙන් එල්.ටී.ටී.ඊයට පහසුකම් සලසා තිබෙනවා. දෙමළ ජනතාවගෙ අවශ්‍යතා එහිදී සැලකිල්ලට ගන්නේ නැහැ. සාමය ලබා ගැනීමේ අරමුණින් දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් පාවා දෙන්න එපා කියලා මම රජයෙන් ඉල්ලනවා" ආනන්ද සංගරී පවසයි.

දෙමළ ජාතිකයන්ගෙන් වැඩි පිරිසක් කොටින්ගේ මර්දනකාරී බලයට බියවී සිටියදී ආනන්ද සංගරී නමැති දේශපාලඥයා නොබියව ඊට මුහුණ දෙයි. ඔහුට ඒ ශක්තිය ලැබී ඇත්තේ වසර 14ක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කිරීම ඇතුළු දීර්ඝ දේශපාලන අත්දැකීම් සමුදාය ඔස්සේය. බාල කාලයේ සිට බලපෑ පවුල් පරිසරය ඊට මුල් වූ බව ඔහුගේ අදහසයි. අධ්‍යාපනය ද ඔහුගේ වත්මන් භූමිකාවට විශාල පිටුවහලක් බව ද ඔහු කියයි. යාපනයේ පේදුරුතුඩුවේ පදිංචි එස්.වීරසිංහම් හා රත්නම් වීරසිංහ යන දෙපළට දරුවන් නවදෙනෙක් වූහ. වීරසිංහම් පුතුර් සිරි සෝමානන්ද විද්‍යාලයේ විදුහල්පතිවරයා විය. වීරසිංහම්ගේ පිරිමි දරුවන් අතරින් ආනන්ද සංගරිද එක් අයෙක් විය.

සොහොයුරන් හත් දෙනෙකුගෙන් හා සොයුරියන් දෙදෙනෙකුගෙන් යුත් සංගරිගේ පවුලේ පස්දෙනෙකු මේ වන විට මියගොස් ඇත.

අච්චුවේලි තර්ස්ටන් විද්‍යාලයෙන් හා පුතුර් සිරි සෝමානන්ද මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ සංගරී පේදුරුතුඩුවේ හිස්ට්‍රි මහා විද්‍යාලයෙන් හා කොළඹ සහිරා මහා විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපනය ලැබීය. මූලික අධ්‍යාපනය නිමාවීමෙන් පසුව ඔහුට රජයේ රැකියාවක් ලැබිණි. ඒ ජාඇල ක්‍රයිස්ට්චර්ච් විද්‍යාලයටය. උදෑසන කාලයේ පාසලේ ඉගැන්වීම් කටයුතු සිදුකළ ඔහු සවස් කාලයේදී කොළඹ නීති විද්‍යාලයේ වැඩිදුර ඉගෙනීම් කටයුතු කළේය. මේ අතරතුර ඔහුට රත්මලාන ජෝන් කොතලාවල විද්‍යාලයට ස්ථාන මාරුවීමක් ලැබිණි. ඔහු දේශපාලනය සඳහා මුලින්ම පා තැබුවේ එහිදීය.

"මුලින්ම මාව දේශපාලනයට සම්බන්ධ කර ගත්තේ ඇන්.එම් පෙරේරා මහත්තය. ඒ 1959 දී. එහිදී කොටහේන උතුර තරුණ පෙරමුණේ සභාපති වශයෙන් පත්වන්න අවස්ථාව ලැබුණ. මුල්ම වතාවට ඡන්දයකට කියල මුහුණ දුන්නේ කොළඹ නගර සභා ඡන්දයට. ඒ 1959 දී. ලංකා සමසමාජ පක්ෂයෙන් තරඟ කළත් දිනන්න බැරිවුණා." මේ අතරතුර දේශපාලනය කිරීමේ වරදට ආනන්ද සංගරී ගුරු වෘත්තියෙන් නෙරපා දැමිණ. ඒ නිසාම පූර්ණ කාලීන දේශපාලකයෙක් වශයෙන් ඔහු සමාජගත විය. එහිදී ලංකා සමසමාජ පක්ෂය සංගරීට භාරදූර වගකීම් පවරා දුන්නේය.

"1960 මාර්තු මහ මැතිවරණයක් තිබුණ. එහිදී මට නාම යෝජනා භාරදෙන්න කිව්වා. මට තරඟ කරන්න වුණේ කිලිනොච්චියට. මම ඒ ප්‍රදේශයට යනකොට කිසිම දෙයක් දන්නෑ. අදුරන කෙනෙක් නෑ. අවසානයේ අභියෝගය භාර අරගෙන සමසමාජ පක්ෂයෙන් ඡන්දයට මුහුණ දුන්නා. දිනන්න බැරි වුණා. නැවතත් ඒ අවුරුද්දේම ජුලිවල මහ මැතිවරණයක් තිබුණා. ඒකටත් තරඟ කළා. 1965 ත් මහ මැතිවරණයට තරඟ කළා. ඒත් ජයග්‍රහණය කරන්න බැරි වුණා." එසේ 1955 සිට, 1965 දක්වා වසර දහයක් ලංකා සමසමාජ පක්ෂය නියෝජනය කළ ආනන්ද සංගරී 1966 දී ලංකා දෙමළ කොංග්‍රසයට එක්විය. එහිදී ගම්සභා මැතිවරණයට කිලිනොච්චිය කොට්ඨාශයෙන් තරඟ කළ ඔහු වැඩි ඡන්ද ලබා ප්‍රථම වරට මහජන නියෝජිතයෙකු ලෙස පත්විය. සංගරී එහිදී ගම්සභාවේ සභාපති ධූරයටද පත්විය. 1969 දී පැවැත් වූ නගරසභා මැතිවරණයටද කිලිනොච්චියෙන් තරඟ කළ ඔහු එහිදී ද වැඩි ඡන්ද ලබා සභාපති ධූරයට පත්වීමට අවස්ථාව උදා කර ගත්තේය. එක් අයෙකුට තනතුරු දෙකක් ලබා ගැනීමට නොහැකි නිසා අධිකරණය මඟින් ඔහුගෙ නගරසභා සභාපති ධූරය බල රහිත කරනු ලැබීය. එහෙත් පසුව 1970 පැවැති නගරසභා මැතිවරණයෙන් වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබා කිලිනොච්චියේ නගර සභාවේ සභාපති ධූරයට පත්විය.

මේ අතර දේශපාලන හේතූන් මත අහිමිකර තිබූ ගුරු පත්වීම නැවත ලබාදීමට ඒ වන විට බලයේ සිටි සමගි පෙරමුණු ආණ්ඩුව කටයුතු කළේය. ඒ අනුව ඔහුට යාපනයේ හින්දු විද්‍යාලයට පත්වීමක් ලැබිණි.

"මේ කාලයේදී තමයි ජී.පී පොන්නම්බලම් මහත්තයාගෙ මූලිකත්වයෙන් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ආරම්භ වුණේ. ඒ 1972 මැයි මාසයේ. ඒකෙදි මම කිලිනොච්චිය කොට්ඨාශය නියෝජනය කරමින් මැතිවරණයට ඉදිරිපත් වුණා. එහිදී ප්‍රථම වතාවට පර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව උදා වුණා. එහෙත් 76 දී නොසිතූ සිදුවීමක් සිදුවුණා."

පක්ෂ නායකයාව සිටි පී.ජී පොන්නම්බලම්ගේ අභාවය නිසා සියල්ල උඩුයටිකුරු වී ගියේය. 77 ජනවාරි යේ දී එස්.ජේ.වී චෙල්වනායගම්ගේ මරණයත් සමග මේ තත්වය තවත් දරුණු විය. එතෙක් කොංග්‍රසය සමග එක්ව දේශපාලනය කළ තොණ්ඩමන් ද වෙනම පාර්ශවයක් ලෙස පෙනීසිටීම සඳහා යයි කියමින් ඉවත්ව ගියේය.

"77 ජුලි මාසයේ මහා මැතිවරණයේ දී අපි ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ විදියට දේශපාලනය ආරම්භ කළා. ප්‍රධාන විපක්ෂය හැටියට පත්වුණා. පසුව ජේ.ආර් මහත්තයා බලය අසීමිත ලෙස පාවිච්චි කරන්න ගත්තා. අපිට එකඟ වෙන්න බැරි කරුණු ගැන දිවුරුම් දෙන්න කිව්වා. නමුත් අපි ඊට එරෙහි වුණා. අවසානයේ පාර්ලිමේන්තුවේ ඉන්න බැරි වුණා. නැවත 1983 ඡන්දය තියන් නැතුව ජනමත විචාරණයක් තියල මැතිවරණය කල් දැම්මා. මේකට විරුද්ධව අපි සටන් කළා. එහිදී අපේ ජාතියට විශාල කරදර සිද්ධ වුණා"

එතැන් සිට 93 දක්වා පැවැති මැතිවරණ සාධාරණ නොවීම නිසා තමන්ට ජයග්‍රහණය කිරීමට නොහැකි වූ බව සංගරී මහතා කියයි.

"මම 93 දි ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ උප සභාපති වශයෙන් පත්වුණා. 94 පැවැති මහ මැතිවරණයට තරඟ කළද ජයග්‍රහණය කරන්න බැරි වුණා. පස්සේ අපි 2000 දී නැවත සංධානයක් වශයෙන් එකතුවෙලා මැතිවරණයට ඉදිරිපත් වුණා. අපි සමග ටෙලෝ, ප්ලොට් සංවිධානත් හිටියා. එහිදී මම යාපනයෙන් ජයග්‍රහණය කළා. නැවත 2001 මැතිවරණයෙනුත් මම වැඩි ඡන්ද 36000ක් අරගෙන යාපනයෙන් ජයග්‍රහණය කළා. ඒත් සාධාරණ මැතිවරණයක් තිබුණේ නෑ"

"මේ ඔක්කොට මුල කොටි. එයාලගෙ පදයට නටන්නැති අයට එහේ ඡන්දයට ඉන්න දෙන්නෑ. ඒ අයට ඕන විදිහට තමයි ඡන්දය කරන්න ඕනේ."

2001 පසුව ඇතිවූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කොටි සංවිධානය සමග අත්සන් කළ සාම ගිවිසුමත් සමග තත්වය තවත් උත්සන්න වූ බව සංගරී මහතා පවසයි.

"කොටින්ගේ උවමනාවට ටෙලෝ, ඊපීඩීපී, ඊ.පී.ආර්.එල්.එෆ් වගේ පක්ෂ නිරායුධ කළ පස්සෙ ඒ නායකයින් මරන්න පටන් ගත්තා. එදා ඉදලා මටත් නොයෙකුත් තර්ජන ගර්ජනවලට මුහුණ දෙන්න වුණා. ඒ කොටින්ගේ පදයට නැටුවේ නැති නිසා. මම කිව්වේ එයාලට ඔය තුවක්කුවේ බලය අතහැරලා ප්‍රජාතන්ත්‍රවාදීව ජනතාවගේ ප්‍රශ්න දිහා බලන්න කියලයි. ඒකට විරුද්ධ වුණු අයට අත්වූයේ මරණයයි. අදත් ඒ පැත්ත නියෝජනය කරන දෙමළ මන්ත්‍රීවරුන් කටයුතු කරන්නේ කොටින්ගේ උවමනාවටයි. එහෙත් කොටි ඔවුන්ට ඕනෑ අය පත්කරගන්න අවශ්‍ය පසුබිම 2004 මැතිවරණ සටනෙදි සිදුකළා. එකෙන් මට විශාල අසාධාරණයක් වුණා. කොටි කවදාවත් අහිංසක දෙමළ ජනතාව ගැන නෙවෙයි බලන්නේ."

ලංකාවේ දෙමළ දේශපාලනය වෙනුවනේ සිය ජීවිතයටම කැප කළ ආනන්ද සංගරී අද දෙමළ දේශපාලනය ගැන කියන්නේ එහෙමය. කොටින්ට එරෙහි වීම නිසා මරණ වරෙන්තුව ලැබ සිටියද, වයසින් මහළුවියට එළඹෙමින් සිටියද ඔහු තවමත් ජනතාවගේ දේශපාලනයෙක් බව සඳහන් කළ යුතුය.

චමින්ද සේනාරත්න

දෙමළ ජාතිකයන්ගෙන් වැඩි පිරිසක් කොටින්ගේ මර්දනකාරී බලයට බියවී සිටියදී ආනන්ද සංගරී නමැති දේශපාලඥයා නොබියව ඊට මුහුණ දෙයි. ඔහුට ඒ ශක්තිය ලැබී ඇත්තේ වසර 14ක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කිරීම ඇතුළු දීර්ඝ දේශපාලන අත්දැකීම් සමුදාය ඔස්සේය. බාල කාලයේ සිට බලපෑ පවුල් පරිසරය ඊට මුල් වූ බව ඔහුගේ අදහසයි. අධ්‍යාපනය ද ඔහුගේ වත්මන් භූමිකාවට විශාල පිටුවහලක් බව ද ඔහු කියයි. යාපනයේ පේදුරුතුඩුවේ පදිංචි එස්.වීරසිංහම් හා රත්නම් වීරසිංහ යන දෙපළට දරුවන් නවදෙනෙක් වූහ. වීරසිංහම් පුතුර් සිරි සෝමානන්ද විද්‍යාලයේ විදුහල්පතිවරයා විය. වීරසිංහම්ගේ පිරිමි දරුවන් අතරින් ආනන්ද සංගරිද එක් අයෙක් විය.

දේශපාලන රස කතා

බණ්ඩාරනායකගේ විහිළු

අගමැති බණ්ඩාරනායක විහිළුතහළුවලට රුසියෙකු බව බොහෝ දෙනා කියති. ඒ බව තහවුරු කෙරෙන කතා ගණනාවක් ඔහුගේ චරිතය ඇවිස්සීමේ දී හමුවෙයි.

දේශපාලන, සංස්කෘතික උත්සව ආදියට යද්දී ජාතික ඇඳුමින් සැරසී යාම බණ්ඩාරනායකගේ සාමාන්‍ය සිරිතයි. එහෙත් දිනක් මහනුවර පැවති එක්තරා සුනඛ ප්‍රදර්ශනයක් නැරඹීමට අගමැතිවරයා ගියේ කලිසම් කෝට් ආදියෙන් සැරසීගෙනය. මෙය දුටු හිතවතෙක් ඒ ගැන ප්‍රශ්න කළේය.

"මොකද අගමැතිතුමා අද කලිසම් කෝට් ඇදගෙන?"

"එහෙම තමා බලු වැඩට බලු ඇඳුම්" අගමැතිවරයාගේ පිළිතුරෙන් මුළු සභාවම සිනා සයුරක ගිලිණි.

තවත් වතාවක අගමැති බණ්ඩාරනායක, සෞඛ්‍ය ඇමතිනි විමලා විජයවර්ධන ඇතුළු පිරිසක් එක්තරා උත්සවයක ප්‍රධාන අමුත්තෝ ලෙස එක්ව සිටියහ. පොල්තෙල් පහන දල්වා උත්සවයේ කටයුතු ඇරඹීමේ අවස්ථාව උදා විය. පළමු පහන් වැටිය දැල්වූයේ අගමැති බණ්ඩාරනායකය. ඊළඟ අවස්ථාව උදාවූයේ සෞඛ්‍ය ඇමතිනි විමලා විජේවර්ධනටය. ඇය තුන්හතර වතාවක් ම උත්සාහ කළ ද පහන් වැටිය දැල්වුණේ නැත. දැල්විය යුතු කෙළවර මිරිකා තෙල් ඉවත් කර නොතිබීම නිසා චිරි චිරි හඬ නැගුණා විනා පහන් වැටිය දැල්වුණේ නැත. ඒ ගැන අවබෝධයකින් කටයුතු නොකළ ඇමතිනිය දිගින් දිගටම පහන් වැටිය දැල්වීමට උත්සාහ කළාය.

"අනේ... අනේ විමලා ඔහොම බැහැ. හොඳට ඔය කොණ මිරිකන්න. එතකොට පත්තුවෙයි. තාම කොණ මිරිකගන්නවත් දන්නෙ නෑ"

සිද්ධිය බලා සිටි අගමැති බණ්ඩාරනායක කී කතාවෙන් විමලා විජයවර්ධන පමණක් නොව අවට සිටිය වුන්ගේද මුහුණ රත්පැහ ගැන්විණි.

අගමැති බණ්ඩාරනායකගේ විහිළු ඔහු සමග ඇසුරු කළ මැතිඇමතිවරුන්ට, වෙනත් හිතවතුන්ට පමණක් සීමාවූයේ නැත. සේවක සේවිකාවන්ට පවා විහිළුතහළු කිරීමට තරම් ඔහු නිහතමානී විය.

බණ්ඩාරනායක පවුල සමග කිට්ටුවෙන් ඇසුරු කරමින් ඔවුන්ගේ කුදුමහත් කටයුතුවලට සහය වූ සේවක පිරිස අතුරින් ඩේවිඩ් සූරියප්පෙරුමට හිමිවන්නේ සුවිශේෂී තැනකි. දොම්පේ ප්‍රදේශයේ උපන් හෙයින් 'දොම්පයා' යන නමින් බණ්ඩාරනායක විසින් හඳුන්වනු ලැබූ ඔහු හොරගොල්ල වලව්වේ නොකළ කටයුත්තක් නැති තරම්ය.

පනස් ගණන්වල අගහරියේ ඩේවිඩ්ට පැවරී තිබූ රාජකාරිය වූයේ හොරගොල්ල වලව්වත්, වත්තත් ආරක්ෂා කිරීමේ කටයුත්තය. තුවක්කුවත් කරගසාගෙන වත්ත වටේ රවුමක් ගොස් පැමිණි ඩේවිඩ් නින්දක් බලාපොරොත්තුවෙන් කාමරයට වැදුණේ ඒ වන විට අලුයම එකද පසුවී තිබුණු හෙයිනි.

එක්වරම වේගයෙන් පැමිණි මෝටර් රථයක් හොරගොල්ල වලව්වේ ගේට්ටුව ඉදිරියේ නතර කෙරිණ. "මේ මහ රෑ මොනඑකාදැයි" හිතමින් ඩේවිඩ් එළිපහළියට විත් විපරම් කළේය. මෝටර් රථය අගමැති බණ්ඩාරනායකගේ කැඩිලත් රථයය. ඩේවිඩ් වහ වහා ගේට්ටුව අසලට දිවගියේය.

"ආ දොම්පය. මොකද කරන්නෙ?"

"මොනවත් නෑ සර්. වත්ත වටේ රවුමක් ගිහින් ආවෙ. කාමරයට යන්නයි හැදුවේ..." ඩේවිඩ් අගමැතිවරයාගේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නේය.

"ආ... කාමරේට යන්නද හැදුවෙ? තනියම ද කාමරේ ඉන්නෙ..."

"ඔව් සර්. වෙන කවුරු ඉන්නද?"

ඩේවිඩ් සීරුමාරුවෙන් අගමැතිවරයාගේ දෙවන ප්‍රශ්නයට ද පිළිතුරු දුන්නේය.

"මොනවටද අයිසෙ, මේ තරුණ වයසෙදි මහ රෑ කාමරේක තනියම ඉන්නෙ. හොඳ ගෑනියෙක් කාමරේට අඩගහගන්නවකො" අගමැතිවරයාගේ ඊළඟ කතාවට උත්තර දෙන්නට තරම් දිරියක් නොතිබුණු ඩේවිඩ් බිම බලාගත්තේය.